රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:09/2007 (VI)

මගේ අංක:-EST-4/REEMP/02-0117,
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යංශය..
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 07
2009.03.09

අමාත්‍යංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

## විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම.

ඉහත මැයෙන් 2007.05.11 දතමින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 9/2007 හා ඊට සංශෝධන වශයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛ කෙරෙහි අවධානය යොමු කරවමි.

02. විශ්‍රාමික රජයේ නිලධාරීන් රාජ්‍ය සේවයේ අනුමත තනතුරු වල නැවත සේවයේ යෙදවීමේදී සතුටුදායක සේවාවක් නොමැති විශ්‍රාමිකයන්ද සේවයට බඳවාගෙන ඇති බව වාර්තා වී ඇත. එහෙයින් විශ්‍රාමිකයෙකු නැවත සේවයට බඳවා ගැනීම සඳහා අමාත්‍යංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජ්‍යසේවා කොමිෂන් සභාව වෙත නිර්දේශ කිරීමේදී මේ සමග අමුණා ඇති ආකෘති පත්‍රයට අනුව තොරතුරු ඉදිරිපත් කළ යුතු අතර එහි 13 වන ජේදය සම්පූර්ණ කිරීමේදී පහත සඳහන් කරුණුද ඊට ඇතුලත් කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

I. අදාල නිලධාරියා මේ වන විට නියමිත බලධාරියා විසින් විධිමත් පරිදි විශ්‍රාම ගන්වා තිබේද , නැතිද යන වග හා එසේ නම් සාමාන්‍ය විශ්‍රාම ගැන්වීමක් ද නැතහොත් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 (1) වගන්තිය යටතේ වන විශ්‍රාම ගැන්වීමක්ද යන වග.

II. අදාල නිලධාරියා විනය හේතුවක්, අකාර්යක්ෂමතාවයක්, අසතුටුදායක සේවාවක් වැනි හේතුවක් මත විශ්‍රාම ගන්වා නොමැති බව.

III. අදාල නිලධාරියා විශ්‍රාම ලැබීමට පෙර සේවා කාලය සතුටුදායක බව හා විනය දඬුවම් ලබා නොමැති බව.

03. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යංශය.

පිටපත්:- පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

# විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම.

01. නිර්දේශිත නිලධාරියාගේ නම:-
02. අයත්වූ සේවාව හා ශ්‍රේණිය:-
03. උපන් දිනය:-
04. ජාතික හැඳුනුම්පත් අංකය:-
05. නැවත සේවයේ යෙදවීමට නිර්දේශිත තනතුර හා එය අයත් සේවාව:-
06. කාලසීමාව:-
07. නිර්දේශිත තනතුරට අදාල තොරතුරු:-

| අනුමත මුළු සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | පුරප්පාඩු ඇතිවීමට හේතු | පුරප්පාඩු ඇතිවූ දිනය | පුරප්පාඩු ස්ථිරව පිරවීමට ඇති බාධාවන් |
|---|---|---|---|---|
| | | | | |

08. මෙම පුරප්පාඩුව ඇති තනතුරෙහි රාජකාරි කටයුතු සේවා ස්ථානයේ සිටින වෙනත් නිලධාරීන්ගෙන් ආවරණය කල නොහැකිද යන්න හා එයට හේතු:-
09. නොඑසේනම් මෙම තනතුරට වැඩබැලීමේ පදනම මත පත්කළ හැකි නිලධාරීන් සිටීද/නැද්ද යන්න හා එසේ නම් ඒ සඳහා එවැනි නිලධාරීන් නිර්දේශ නොකිරීමට හේතු:-
10. නිලධාරියා අවසාන වරට සේවය කරන ලද තනතුර:-
11. සේවා ස්ථානය:-
12. නිලධාරියා විශ්‍රාම ගත් දිනය:-
13. විශ්‍රාම ගත් ආකාරය:-
14. මීට ප්‍රථම නැවත සේවයේ යොදවාගෙන ඇතිද යන වග:-
15. එසේනම් ඒ කුමන තනතුරකට ද යන වග, ඒ සඳහා අනුමැතිය ලබාදුන්නේ කවුරුන් විසින්ද යන වග හා අදාල පත්වීමේ කාලසීමාව:-
16. මෙම නිලධාරියා නිර්දේශ කිරීමට විශේෂිත වූ කරුණු:-
17. නිලධාරියාට එරෙහිව විනය පරීක්ෂණ පවතීද/පැවතියේද යන වග:-
18. නිලධාරියාට එරෙහිව විනය පරීක්ෂණ පැවතියේ නම් විනය නියෝගය කුමක්ද යන වග:-

.......................................

දිනය:- දෙපාර්තමේන්තු ප්‍රධානියා

දිනය:- .......................................

අමාත්‍යාංශ ලේකම්